# භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
## திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
## Department of Treasury Operations

තැ.පෙ.1559, මහා භාණ්ඩාගාරය, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
தபெ. 1559,பொது திறைசேரி, நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு, கொழும்பு 01, இலங்கை
P.O Box: 1559, General Treasury, Ministry of Finance, Economic Stabilization & National Policies, Colombo 01, Sri Lanka

| | | | | |
|---|---|---|---|---|
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | දුරකථන<br>தொலைபேசி<br>Telephone | +94 11 2484600<br>+94 11 2484700 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | +94 11 2484970<br>+94 11 2320042 |
| | | | වෙබ් අඩවිය<br>இணையதளம்<br>Website | www.treasury.gov.lk |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | TO/REV/01/02/01 | ඔබේ අංකය<br>உமது இல<br>Your | 23.05.2025 |

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
විශේෂ වියදම් ඒකක ආයතන ප්‍රධානීන්

**<u>2026 වර්ෂය සඳහා ආදායම් ඇස්තමේන්තු</u>**

රාජ්‍ය ආදායම් ඇස්තමේන්තු කිරීම, රැස් කිරීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශයන් ඇතුළත් රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 01/2015 හා 2015.07.20 දිනැති චක්‍රලේඛය සහ ඒ සඳහා කරනු ලැබූ සංශෝධන ඇතුළත් 2016.12.30 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 (V) පිළිබඳව සහ 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හා ඒ සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් 2020.10.14 දිනැතිව නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 03 හි සඳහන් උපදෙස් කෙරෙහි ඔබගේ අවධානය යොමු කෙරේ.

02. ඒ අනුව ඔබ අමාත්‍යාංශය හා ඔබ යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු මඟින් පහත අංක 04 හි දක්වා ඇති ආදායම් සංකේතාංක සඳහා ඇස්තමේන්තු තොරතුරු ගෙන්වාගෙන අමාත්‍යාංශය මඟින් 2026 වර්ෂය සඳහා එක් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුවේ. තවද, විශේෂ වියදම් ඒකක ආයතන ප්‍රධානීන් විසින් (ශීර්ෂ අංක 1 සිට 25 දක්වා) සෘජුවම භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ආදායම් ඇස්තමේන්තු යොමු කළ යුතු වේ.

03. පහත අංක 04 ඡේදයේ දක්වා ඇති ආදායම් සංකේතාංක සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් කටයුතු කරනු ලැබේ. එකී ආදායම් සංකේතාංක යටතේ වන ආදායම් එකතු කිරීමේ වගකීම පැවරී ඇති ඔබ අමාත්‍යාංශය හා ඔබ යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු විසින්, එක් එක් ආදායම් සංකේතාංක යටතේ 2026 වර්ෂය තුල එකතු කිරීමට අපේක්ෂිත ආදායම් පිළිබඳ ඇස්තමේන්තු මු.රෙ. 85 (1), (2) ප්‍රකාරව හැකිතාක් තාත්විකව හා නිවැරදිව සකස් කර භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළයුතු වේ.

04. ඒ අනුව, පහත සඳහන් ආදායම් සංකේතාංක යටතේ 2026 වර්ෂය සඳහා ඔබ අමාත්‍යාංශය හා විශේෂ වියදම් ඒකක ආයතන ප්‍රධානීන් මඟින් එකතු කිරීමට අපේක්ෂිත ආදායම් පිළිබඳව ඇස්තමේන්තු මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍ර අංක. TOD/REV/03 අනුව සකස් කර 2025.06.13 දින හෝ ඊට පෙර revenue@tod.treasury.gov.lk / jayathilake.jamm@tod.treasury.gov.lk යන විද්‍යුත් ලිපින වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

| <u>සංකේතාංකය</u> | <u>විස්තරය</u> |
|---|---|
| 20.02.01.99 | රජයේ වත්කම් වලින් ලැබෙන ආදායම - කුලී - අනෙකුත් කුලී |
| 20.02.02.99 | පොලිය - අනෙකුත් |
| 20.03.01.00 | විකුණුම් සහ ගාස්තු - දෙපාර්තමේන්තුමය විකිණීම් |
| 20.03.02.99 | විකුණුම් සහ ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් - විවිධ |
| 20.03.03.02 | විකුණුම් සහ ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම් - අනෙකුත් |
| 20.03.99.00 | විකුණුම් සහ ගාස්තු - අනිකුත් ලැබීම් |
| 20.05.99.00 | වර්තන පැවරීම් - ජාතික ලොතරැයි මණ්ඩලය හා අනෙකුත් පැවරුම් |

05. මේ සම්බන්ධව තවදුරටත් පැහැදිලි කිරීම් අවශ්‍ය වන්නේ නම් 0112484994 දුරකථන අංකයෙන් මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ(ආදායම්) අමතන්නේ නම් මැනවි.

ඒ.එන්.හපුගල
අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

පිටපත් :- 01. විගණකාධිපති
02. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

( ආකෘති පත්‍ර අංක. TOD/REV/03 )

# වසර 2026 සඳහා ආදායම් ඇස්තමේන්තු

(i) ව්‍යවස්ථාව/ අධිකාරිය : ( අදාල නීති රීති හෝ චක්‍රලේඛ උපදෙස් )

(ii) අදාල අමාත්‍යාංශය/ විශේෂ වියදම් ඒකක ආයතනය :- වැය ශීර්ෂ අංක :-

(iii) ආදායම් අයිතමය :-

(iv) ආදායම් සංකේතාංකය :-

| විස්තරය | ආදායම 2024 | ඇස්තමේන්තු ආදායම 2025 වර්ෂය | | | වසර 2026 සඳහා ඇස්තමේන්තු කළ ආදායම | පුරෝකථන | | 3 වන සහ 4 වන තීරු අතර වෙනස පිළිබඳව හේතු | 4 සහ 6 වන තීරු අතර වෙනස (වැඩිවීම හෝ අඩුවීමට හේතු ) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූලික ඇස්තමේන්තුව | සංශෝධිත ඇස්තමේන්තුව | 2025. 05. 31 දින දක්වා සත්‍ය ආදායම | | 2027 | 2028 | | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | | |
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) | (10) |
| | | | | | | | | | |

( 9 හා 10 තීරු සඳහා වලංගු හේතුන් අනිවාර්යයෙන්ම සඳහන් කල යුතුය. )

නිවැරදි බවට සහතික කරමි

..............................................................

ලේකම්/විශේෂ වියදම් ඒකක ආයතන ප්‍රධානින්

( නිල මුද්‍රාව )

දිනය:-